මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය		
දෙවන වාර පරීක්ෂණය - 2018		
ගෘහ ආර්ථික විද්‍යාව	**10 ශ්‍රේණිය**	**කාලය පැය. 01 යි**

නම: ....

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1) ''පවුලක්'' යනු ජීවත් වීමට අවශ්‍ය ඉඩ ප්‍රමාණය හා මූලාශ්‍ර, සම්පත් බෙදා හදා ගනිමින් කාලයක් තිස්සේ එකම ඉලක්කයක් කරා යාමට සංවිධානය වන, එකිනෙකා අතර බලපෑමක් ඇති කරන පුද්ගලයින්ගෙන් සමන්විත සහයෝගී ඒකකයකි.

   පවුල පිළිබඳ ඉහත නිර්වචනය ඉදිරිපත් කර ඇති විද්‍යාඥයින් වන්නේ,

   i. ජී.පී. මර්ඩොක්   ii. හොක් සහ පැවොලුසි

   iii. කැත්ලින් ගෆ්   iv. විලියම් ගිල්බ්‍රත්

2) විස්තෘත පවුල හැඳින්වෙන තවත් නමකි,

   i. බද්ධ පවුල.   ii. සමීප පවුල.

   iii. අණු පවුල.   iv. ඒකීය පවුල.

3) නිවාස සැලසුම් ඇඳීමේදී අවධානය යොමු විය යුතු කරුණකි.

   i. පරිමාණය.   ii. ඔප්පුවේ නිරවුල් බව.

   iii. අවට පරිසරය.   iv. මූල්‍යමය පහසුකම්.

4) නිවසේ බිම් සැලැස්ම ඇඳීමේ දී වහලෙයි උස සඳහා සිවිලිමේ සිට තැබිය යුතු අවම උස ප්‍රමාණය වන්නේ,

   i. අඩි $7^1/_2$ කි.   ii. අඩි 8 කි.

   iii. අඩි 10 කි.   iv. අඩි $9^1/_2$ කි.

5) පුද්ගලයෙකුගේ සිතේ ඇති වන හිතකර හා අහිතකර හැඟීම් හඳුන්වනු ලබන්නේ,

   i. ආකල්ප   ii. ශ්‍රමය.

   iii. කුසලතා   iv. දැනුම.

6) මානව සම්පතක් හා භෞතික නොවන සම්පතක් ලෙස පිළිවෙලින් දක්වා ඇත්තේ,

i. ආකල්ප, කුසලතා. ii. ශ්‍රමය, කාලය.

iii. විදුලිය, ඉන්ධන. iv. මුදල්, කාලය.

7) කිසියම් කාර්යක් සඳහා අවම වශයෙන් ඉඩකඩ හෝ අවකාශ තිබීම එම කාර්යයේ .... කෙරෙහි වැදගත් වේ.

i. අරපිරිමැස්ම ii. කාර්යක්ෂමතාව iii. කුසලතාව iv. ලාභය.

8) ඔබගේ නිවසට හදිසියේ පැමිණෙන අමුත්තෙකු සඳහා <u>ආහාර සැකසීමේදී</u> ඔබ යොදා ගනු ලබන සම්පත් වන්නේ,

i. කුසලතා, ඉඩකඩ, දේපල. ii. ශ්‍රමය, දේපළ, ප්‍රජා පහසුකම්.

iii. දැනුම, ශ්‍රමය, ඉන්ධන. iv. කාලය, විදුලිය, ප්‍රජා පහසුකම්.

9)

ඉහත දැක්වෙන සංඛේත පිළිවෙලින්,

i. ජනේලය, බිත්තිය, ෆැන්ලයිට්. ii. ජනේලය, ෆැන්ලයිට්, බිත්තිය.

iii. ෆැන්ලයිට්, බිත්තිය, ජනේලය. iv. ෆැන්ලයිට්, ජනේලය, බිත්තිය.

10) ඉඩකඩ පිරිමසන ගෘහභාණ්ඩයකි,

i. තට්ටු ඇඳ. ii. ඩිවානය.

iii. බුමුතුරුණු. iv. ලාම්පු ආවරණ.

11) අප ගනු ලබන ආහාර අවසානයේ ශරීර ශක්තිය ලබා ගැනීමට උපකාර වේ. එම ක්‍රියාවලිය පිළිවෙලින් දැක්වෙන්නේ,

i. ආහාර → ජීරණය → පරිභෝජනය → අවශෝෂණය → පරිවහනය → පරිවෘත්තිය.

ii. ආහාර → පරිභෝජනය → අවශෝෂණය → ජීරණය → පරිවහනය → පරිවෘත්තිය.

iii. ආහාර → පරිභෝජනය → ජීරණය → අවශෝෂණය → පරිවෘත්තිය → පරිවහනය.

iv. ආහාර → පරිභෝජනය → ජීර්ණය → අවශෝෂණය → පරිවහනය → පරිවෘත්තිය.

12) කරල් එළවළුවක් ලෙස නම් කළ හැක්කේ,

i. කතුරුමුරුංගා. ii. නෝකෝල්

iii. දඹල. iv. කැකිරි.

13) බීටා කැරොටින් බහුලව ඇත්තේ,

i. රතු පැහැති එළවළුවලය.
ii. සුදු පැහැති එළවළුවලය.
iii. තැඹිලි පැහැති එළවළුවලය.
iv. කහ පැහැති එළවළුවලය.

14) යකඩ වැඩිපුරම අඩංගු පලාවර්ගයකි.(පෝෂණ වගුවට අනුව)

i. ගොටුකොළ.
ii. මුකුණුවැන්න.
iii. තම්පලා.
iv. කතුරුමුරුංගා.

15) ආහාර පිරමීඩයට අනුව දෛනික ආහාර වේලට වැඩිපුරම එකතු කළ යුතු වන්නේ,

i. බත්, පාන්, ධාන්‍ය හා අල බතල.
ii. තෙල් හා සීනි.
iii. එළවළු, පළතුරු.
iv. මස්, මාළු, කිරි, බිත්තර.

16) සිරුරට දෛනිකව කුඩා ප්‍රමාණවලින් අවශ්‍ය වන එහෙත් සිරුරේ පැවැත්ම සඳහා වැදගත් කෘත්‍යයන් ඉටු කරන පෝෂක වන්නේ,

i. මේද, ප්‍රෝටීන්.
ii. ඛනිජ, විටමින්.
iii. කාබෝහයිඩ්‍රේට්, මේද
iv. ප්‍රෝටීන්, ඛනිජ.

17) සුක්‍රෝස්වල අණුක සූත්‍රය වනුයේ,

i. $C_6H_{12}O_6$
ii. $(C_6H_{10}O_5)_n$
iii. $C_{12}H_{22}O_{11}$
iv. $C_6H_{12}O_{11}$

18) අප එදිනෙදා ගනු ලබන වැඩිපුර කාබෝහයිඩ්‍රේට් සිරුර තුළ දී අක්මාව හා පේශි තුළ .... ලෙස තැන්පත් කර, නැවත සිරුරට ශක්තිය අවශ්‍ය විට දී .... බවට පත්කර ලබා දෙයි. (පිළිවෙලින් හිස්තැන්වලට ගලපන්න.)

i. ග්ලූකෝස්, ග්ලයිකෝජන්.
ii. ග්ලයිකොජන්, ග්ලූකෝස්.
iii. ඇමයිනෝ අම්ල, ග්ලූකෝස්.
iv. ග්ලූකෝස්, ඇමයිනෝ අම්ල.

19) පෝෂණ වගුවේ මහා පෝෂක දක්වා ඇත්තේ,

i. ග්‍රෑම් වලින්.
ii. මයික්‍රො ග්‍රෑම් වලින්.
iii. මිලි ග්‍රෑම් වලින්.
iv. කැලරි වලින්.

20) ආහාරවල දක්නට ලැබෙන ගුණාත්මක ලක්ෂණයක් නොවන්නේ,

i. පෝෂණ අගය.
ii. වයනය.
iii. රසය.
iv. බර

21) දියාරු පිටි මෝලියක් භාවිතා කර සාදා ගත හැකි ආහාරයකි,

i. බනිස්
ii. කොකිස්.
iii. පාන්.
iv. මාළු පාන්.

22) සංවහනය මඟින් තාපය සංක්‍රාමනය වී පිසීම සිදු කර ගත හැකි ආහාරයකි.

i. රොටී.
ii. පැන්කේක්.
iii. පිට්ටු.
iv. කේක්.

23) තෙත් තාපයෙන් පිසීමේ ක්‍රමයකි,

i. උඳු වාෂ්පයෙන් තැම්බීම.
ii. ටෝස්ට් කිරීම.
iii. ග්‍රිල් කිරීම.
iv. රෝස්ට් කිරීම.

24) වැඩි සාන්ද්‍රණයකින් යුත් මාධ්‍යයක සිට අඩු සාන්ද්‍රණ මාධ්‍යයකට ද්‍රව්‍ය අංශු ගමන් කිරීම හඳුන්වන්නේ,

i. බාහිර ආස්‍රැතිය.
ii. විසරණය.
iii. සංවහනය.
iv. විකිරණය.

25) එළවළු කැපීමේ දී මි.මි. 3 ක ඝනකමට හතරැස් කොටු කපා ගැනීම නම් කරන්නේ,

i. ජුලියන් ක්‍රමය. ii. මසදුවාන් ක්‍රමය.

iii. බෲනුවාස් ක්‍රමය. iv. පෙයිසැන් ක්‍රමය.

26) ෂෝට් ක්‍රස්ට් පේස්ට්‍රිය පිළියෙල කිරීමේ දී තිරිඟු පිටි හා මාගරින් අතර අනුපාතය වන්නේ,

iii. 1:2 ii. 2:1 iii. 2:3 iv. 3:1

27) පිටි මෝලියක් සකස් කිරීමේ දී තිරිඟුවල අඩංගු කුමන ප්‍රෝටීනය එහි ඇදෙන සුළු බව ගෙන දීමට හේතු වන්නේ ද?

i. ලෙගියුමින්. ii. සෙයින්.

iii. ඉලාස්ටින්. iv. ග්ලූටන්.

28) ක්‍ෂුද්‍ර ඛනිජවලට උදාහරණ වන්නේ,

i. පොටෑසියම්, මැග්නීසියම්. ii. සෝඩියම්, පොටෑසියම්

iii. සින්ක්, ෆ්ලෝරයිඩ්. iv. සින්ක්, සෝඩියම්.

29) ඔලෙයික් අම්ලය අඩංගු තෙල් වර්ගයකි,

i. පොල්තෙල්. ii. ඔලිව් තෙල්

iii. තල තෙල් iv. රටකජු තෙල්

30) විටමින් B_6 හඳුන්වන රසායනික නාමය වන්නේ,

i. තයමින්. ii. නයසීන්.

iii. සයනොකොබැලමින්. iv. පිරිඩොක්සීන්.

31) නිර්මාණයකින් ඉටුවිය යුතු කාර්යය නිසි පරිදි ඉටුවන සේ සැකසී තිබීම හඳුන්වන්නේ,

i. ක්‍රියානුරූපී බව. ii. නිර්මාණාත්මක බව.

iii. අලංකාර බව. iv. සජීවී බව.

32) උපාංගයක් නිර්මාණය කිරීමට භාවිතා කරන මෙවලම් සඳහා උදාහරණ වන්නේ,

i. රිබන්, රේන්ද. ii. බොත්තම්, කෝඩ්.

iii. දිදාලය, දැතිරෝදය. iv. දැති රෝදය, රෙදි.

33) මැහුම් ක්‍රම වර්ගීකරණයේ දී බෙදෙන ප්‍රධාන කොටස් තුන වන්නේ,

i. මූලික/විසිතුරු/පොළොව්. ii. මූලික/විසිතුරු/ශිල්පීය ක්‍රම.

iii. විසිතුරු/මූලික/විවර. iv. ශිල්පීය ක්‍රම/මූට්ටු/වාටි.

34) විවර පියවීමේ ක්‍රමයක් නොවන්නේ,

i. දෙපෙති ජන්තු. ii. හාක්ක සහ මුදු.

iii. සැන ගාංචු iv. බික්කු.

35) සිහින් නූල් දුවවීම යොදා ගත නොහැකි අවස්ථාවකි,

i. ක්විල්ට් කිරීමට. ii. එළලීමට.

iii. දෙපොටක් මූට්ටු කිරීමට. iv. සිප්පි වාටි මැස්මට.

36) ශාකමය කෙඳි පමණක් දැක්වෙන පිළිතුර වන්නේ,

i. රෙයෝන්, ටෙරලින්, නයිලෝන්. ii. ලිනන්, කපු, හණ.

iii. විස්කෝස්, සේද, ලෝම. iv. කපු, නියඳ, ඕර්ලෝන්.

37) ළදරු ඇඳුම් මැසීමට එහි පතොරම සකස් කිරීමේ දී දුඹුරු කඩදාසිය ගත යුතු දිග, පළල නිවැරදිව දැක්වෙන්නේ,

i. 52cm X 54cm ii. 52cm X 25cm

iii. 52cm X 52cm iv. 25cm X 25cm

38) පහත දැක්වෙන කාර්යයන් ඉටු කර ගැනීමට යොදා ගත හැකි මැසීමේ ශිල්පීය ක්‍රමය වන්නේ,

A - ළදරු හා ළමා ඇඳුම්වල විවර පියවීමට. B - මුදුවක් සාදා උපාංගයක් එල්ලීම.

i. රේන්ද ඇල්ලීම. ii. පොලොව් යෙදීම.

iii. ක්විල්ට් කිරීම. iv. ටේප් ඇල්ලීම.

39) නොමැසූ අද්දරට විකර්ණාකාර පටියක් හෝ කෙළින් පටියක් අල්ලා එය සම්පූර්ණයෙන්ම නොපිටට නවා මැසීමෙන් සකස් කර ගත හැක්කේ,

i. පෝරු වාටියයි. ii. අතිජාදන මූට්ටුවයි.

iii. පැතලි මූට්ටුවයි. iv. විවෘත පැතලි මූට්ටුවයි.

40) පහත දැක්වෙන විසිතුරු මැහුම් ක්‍රම පිළිවෙලින්,



i. කතිර, බ්ලැන්කට්, ලේසිඩේසි.

ii. බ්ලැන්කට්, නැටි, ලේසිඩේසි.

iii. බ්ලැන්කට්, කතිර, ලේසිඩේසි.

iv. කතිර, බ්ලැන්කට්, දම්වැල්.

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය		
දෙවන වාර පරීක්ෂණය - 2018		
ගෘහ ආර්ථික විද්‍යාව	**10 ශ්‍රේණිය**	**කාලය පැය 02 යි**

නම: ....

II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව සම්පූර්ණ ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පහත සිද්ධිය අධ්‍යයනය කර දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1) නිමල් හා නිලන්ති දරුවන් දෙදෙනෙකුගේ දෙමව්පියන් වන අතර වැඩිමහල් දියණිය පෙරපාසල් වියේ පසු වෙයි. අනෙක් දරුවා මාස 8 ක් වයසැති පුංචි පුතෙකි. නිමල් නගර සභාවේ කම්කරුවෙක් ලෙස සේවය කරයි. නිලන්ති තම දරු දෙදෙනාගේ කටයුතු සිදුකරන අතර විවේක වේලාවට නිවසේ විසිතුරු මල් වගා කරමින් කුඩා ව්‍යාපාරයක් ද කරගෙන යයි. නිමල්ගේ මව අවුරුදු 70 ක් පමණ වයස අතර ඇය අංශභාග රෝගය නිසා එක්තැන් වී සිටී. ඇයගේ සියලු දෛනික කටයුතු සිදුවන්නේ ද නිලන්ති අතිනි. මේ සියලු අභියෝගවලට මුහුණ දෙමින් පවුලේ සියලු දෙනා සතුටින් ජීවත් වෙති.

i. මෙම පවුල කුමන පවුල් වර්ගයට අයත් වේද? (ල. 02)

ii. එක්තැන් වී සිටින තම නැන්දනියට රාත්‍රී ආහාරය පිළියෙල කිරීමේදී නිලන්ති සලකා බැලිය යුතු කරුණු දෙකක් සඳහන් කරන්න. (ල. 02)

iii. කම්කරුවෙක් ලෙස සේවය කරන තම සැමියා <u>කුසලතාව</u> හා <u>ශ්‍රමය</u> උපරිමයෙන් යොදවා අවංකව සේවය කරන අතර ඔහුගේ මෙම ලක්ෂණ ගෘහීය සම්පත් වර්ගීකරණයේ කුමන සම්පත් ගනයට අදාළ වේද? (ල. 02)

iv. තම මාස 8 ක් වයසැති දරුවාට ගවුමක් මැසීමට රෙදි මිළදී ගැනීමට වෙළෙඳපොලට ගිය නිලන්ති විසින් තෝරා ගත යුතු රෙදි වර්ග දෙකක් නම් කරන්න. (ල. 02)

v. කම්කරුවෙකු ලෙස සේවය කරන නිමල් තම උපරිමයෙන් පවුලේ අවශ්‍යතා සපුරාලීමට උත්සාහ දරයි. පවුලේ අවශ්‍යතා ප්‍රධාන ලෙස වර්ග කෙරෙන කොටස් 4 නම් කරන්න. (ල. $1/_2 X4 = 2$)

vi.

1. පවුලක පැවතුම් කාලය ප්‍රධාන අවධි කීයකට දැක්විය හැකිද?
2. නිමලුත්, නිලන්තිත් ඒ අතරින් කුමන පවුල් අවධියකට අයත් වේද? (ල. 1x2=2)

vii. පෙර පාසල් යන දියණියක වැඩිපුර පිටි සහිත ආහාර ගැනීමට පුරුදු වී සිටින අතර වයසට වඩා වැඩි වර්ධනයක් දක්නට ලැබේ. පිටි සහිත ආහාර වැඩිපුර ගැනීමෙන් ඇති වන අහිතකර ප්‍රතිඵල 2ක් දක්වන්න. (ල. 02)

viii. නිලන්ති නිවසේ දෛනික කාර්යය වල නිරත වන විට ඉතා පරිස්සමින් උපකරණ හා මෙවලම් භාවිතා කරයි. ඒ මන්ද යත් කුඩා තුවාලයක් සිදු වූ වත් නොනැවතී ලේ ගලන අතර රුධිරය කැටි ගැසීමට ප්‍රමාද වේ. මීට හේතු වූ ඇයට ඌන විටමිනය කුමක්ද? (ල. 02)

ix. පෙර පාසල් යන දියණියට විධිමත් ලෙස තම වතුර බෝතලය රැගෙන යාමට නිලන්ති විසින් උපාංගයක් නිර්මාණය කර දෙන ලදී.

1. එය නම්කරන්න. (ල. 01)

2. එයට යොදා ගත් තුනී පැඩිං රෙද්දෙන් ආවරණය කර කුමන මැහුම් ක්‍රමයට භාජනය කළේද?(ල.1)

x. විසිතුරු මල්වගාවේ යෙදෙන නිලන්ති ඒ සඳහා යොදා ගන්නා භෞතික සම්පත් 2 ක් නම් කරන්න. (ල. 02)

2) සියලු ජීවීන්ගේ පැවැත්ම සඳහා ශක්තිය අවශ්‍ය වේ. එම ශක්තිය සපයා ගැනීමට පෝෂ්‍ය පදාර්ථ අඩංගු ආහාර තෝරා ගැනීමට වැදගත් වේ.

i. කාබෝහයිඩ්‍රේට් වර්ගීකරණයේ දී බෙදෙන ප්‍රධාන කොටස් 3 නම් කර ඊට අදාළ අණුක සූත්‍ර ලියා දක්වන්න. (ල. 03)

ii. ප්‍රෝටීන්වල කෘත්‍යයන් 3 ක් දක්වන්න. (ල. 03)

iii. විටමින් වර්ගීකරණයේ දී මේද ද්‍රාවී විටමින් ගනයට අයත් විටමින් වර්ග 4 නම් කරන්න. (ල. 04)

3) දෛනිකව අප ලබාගන්නා ආහාර වේල් මත අපගේ පෝෂණය රඳී පවතී. එබැවින් ආහාර වේල් සැලසුම් කිරීම අතිශය වැදගත් වේ.

i. ආහාර වේල් සැලසුම් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 3 ක් ලියන්න. (ල. 03)

ii. වෙළෙඳපොලෙන් බිත්තර මිළදී ගැනීමේ දී සලකා බැලිය යුතු ගුණාත්මක ලක්ෂණ 3 ක් ලියන්න. (ල. 03)

iii. පෝෂණ වගුව ආහාර වේල් සැලසුම් කිරීමේ දී අතිශය වැදගත් වේ. පහත සඳහන් පෝෂ්‍ය පදාර්ථවල බර දක්වා ඇත්තේ කිනම් ඒකක වලින් ද?

- ප්‍රෝටීන් -
- විටමින් C -
- කැල්සියම් -
- කැරොටින් -

4) එලවළු හා පළතුරු අපගේ ආහාර වේලට ඇතුළත් කිරීමෙන් ශරීරය ලෙඩ රෝගවලින් ආරක්ෂා කර දෙයි.

i. එළවළුවල අඩංගු ස්වාභාවික වර්ණක 3 ක් නම්කරන්න. (ල. 03)

ii. ''ඔක්සිකරණය'' කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03)

iii. ආහාර පිළියෙල කිරීමේ ශිල්පීය ක්‍රම 4ක් දක්වා එක් එක් ශිල්පීය ක්‍රමය භාවිතා කර සකස් කරගත හැකි ආහාරයක් ඉදිරියෙන් සටහන් කරන්න. (ල. 04)

5) මෙලොව බිහිවන සෑම පුද්ගලයෙකුම අයත් වන පළමු වැනි සමාජ ඒකකය පවුල වේ.

i. න්‍යෂ්ටික හා විස්තෘත පවුල්වල දක්නට ඇති ලක්ෂණ 3 බැගින් වගුගත කරන්න. (ල. 03)

ii. නිවාස සැලසුම් ඇඳීමේ දී අවධානය යොමු විය යුතු කරුණු අතර තවත් එක් කරුණකි ''රාශිකරණය''

1. රාශිකරණය යන්න හඳුන්වන්න. (ල. 01)

2. නිවසක රාශිකරණය භාවිතා කර සැලසුම් කළ ස්ථාන දෙකක් දක්වන්න. (ල. 02)

iii. ඔබ පාසලේ පැවැත්වෙන ක්‍රීඩා උත්සවයේ සංග්‍රහ කටයුතු ඔබ ඇතුළු සාමාජිකයින් 4 දෙනෙකුට භාර වී ඇතැයි සිතන්න. දක්වා ඇති කරුණු ඉටු කර ගැනීමට ඔබ යොදාගත් සම්පත් ගලපන්න. (ආකල්ප, දැනුම, ශ්‍රමය, මුදල්)

A. සංග්‍රහය සිදුකරන අවස්ථාව අනුව ආහාර වර්ග තෝරා ගැනීමට.

B. ස්ථානය පිළියෙල කිරීමට.

C. ආහාර ද්‍රව්‍ය මිළදී ගැනීමට.

D. පිරිසිදු, පෝෂ්‍යදායී ආහාර වේලක් ලබා දීමට කටයුතු කිරීමට. (ල. 04)

6) අනාගතයේ යහපත් ගෘහනියක් වීමට බලාපොරොත්තු වන ඔබට ගෘහීය අවශ්‍යතා සඳහා අලංකාර නිර්මාණ සකස් කර ගැනීමට රෙදි පිළි තාක්ෂණය හැදෑරීම ඉතා වැදගත් වේ.

i.

1. ''උපාංගයක්'' යන්න කෙටියෙන් හඳුන්වන්න. (ල. 01)

2. උපාංග භාවිතයෙන් නිවස තුළ ඇති කර ගත හැකි ලක්ෂණ 2 ක් නම් කරන්න. (ල. 02)

ii. උපාංගවල ඍජු හා වක්‍ර අද්දර නිම කිරීමට යොදා ගත හැකි ක්‍රම 03 ක් නම් කරන්න. (ල. 03)

iii. ඔබ පන්ති කාමරයේ ප්‍රායෝගිකව සිදුකළ

a. මූලික මැහුම් ක්‍රමයක් -

b. විසිතුරු මැහුම් ක්‍රමයක් -

c. මූට්ටු වර්ගයක් -

d. විවර පියවීමක් - නම් කරන්න. (ල. 04)

7) රෙදි නිෂ්පාදනය සඳහා විවිධ කෙඳි වර්ග භාවිතා කරනු ලැබේ.

i. ස්වාභාවික කෙඳි බෙදෙන ප්‍රධාන කොටස් 3 දක්වා උදාහරණ 1 බැගින් ලියන්න. (ල. 03)



ii. ළදරු ඇඳුමක තිබිය යුතු විශේෂ ලක්ෂණ 3 ක් නම් කරන්න. (ල. 03)

iii. ඔබ මසා නිම කළ ළදරු ඇඳුමේ

A. උරහිසට යෙදූ මූට්ටුව නම් කරන්න.

B. වාටියට යෙදූ මැහුම් ක්‍රමය නම් කරන්න.

C. අත්කට මැසීමට යොදා ගත් මැහුම් ක්‍රමය නම් කරන්න.

D. විවරය පියවීමට භාවිතා කල ක්‍රමය නම් කරන්න. (ල. 04)